**ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2015**

-----------------------------------------------------------------------

ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධනය කිරීමේ වැඩසටහනේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලං ර) සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල (කෘසංජාඅ) අතර 2010 පෙබරවාරි 23 දින එළඹි අංක 797-එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ IX ව්‍යවස්ථාවේ 9.03 කොටස සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------------

ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධනය කිරීමේ වැඩසටහනේ මූල්‍ය ගිවිසුම අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව වැඩසටහනේ ප්‍රධාන නියෝජිතායතනය විය. කෙසේ වෙතත් කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදලෙහි 2013 ජනවාරියේදී මධ්‍ය කාලීන දූත සමාලෝචනයෙන් පසු නිර්දේශයන්ට අනුව, “දිවි නැඟුම” වැඩසටහන සමඟ සම්බන්ධ වීමට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ප්‍රධාන නියෝජිතායතනය ලෙස නම් කර තිබුණි. 2015 අප්‍රේල් 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 15/0519/605/009-1 අනුව, වැඩසටහන පසුව ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත මාරු කරන ලදී. වර්තමානයේ වැඩසටහනේ ක්‍රියාකාරකම් ජනාධිපති ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරයි. (අ) වෙළඳපල දාමය සංවර්ධනය සහ ගොවිපළේ අයකරන මිල, ගොවිපළේ පලදාව සහ පෙරසැරි ගොවි නිෂ්පාදනවලට වටිනාකම එකතු කිරීම වැනි සම්බන්ධතාවලට සහභාගී කරවීම හරහා ඔවුන්ගේ ආදායම වැඩිකිරීම සහ (ආ) දියුණු සහ වැඩි ප්‍රමාණයක රැකියා අවස්ථා ඔවුන් වෙත පිරිනැමීමට ඉඩම් අහිමි සහ තරුණයන්ට මූල්‍ය සහ පුහුණු ප්‍රතිපාදන වෙන් කිරීම මඟින් සුළු ඉඩම් හිමි ගොවීන් හා ඉඩම් නොමැති විශේෂයෙන් තරුණයන්ට සහය වීම වැඩසටහනේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 4,309.52 කට සමාන එජඩො මිලියන 32.96 ක් වූ අතර ඉන් රු.මිලියන 3,268.75 කට සමාන එජඩො මිලියන 25 ක් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල විසින් සැපයීමට එකඟ වී ඇත. ඉතිරි අරමුදල් වටිනාකම ශ්‍රී ලංකා රජය, පුද්ගලික සමාගම්, නිෂ්පාදකයින්, ප්‍රජා මූල සංවිධාන සහ සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් දායක වීමට අපේක්ෂිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 පෙබරවාරි 01 ආරම්භ කරන ලද අතර 2016 මාර්තු වන විට නිම කිරීමට නියමිත විය. කෙසේ වෙතත් වැඩසටහන අවසන් වන දිනය 2017 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට සහ ව්‍යාපෘති විගණනය සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල් මාර්ගෝපදේශයට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත්

විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් වැඩසටහන විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහන් වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් වැඩසටහන විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මතය**

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට හා ව්‍යාපෘති විගණනය සඳහා වන කෘසංජාඅ මාර්ගෝපදේශයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් වැඩසටහන විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

2016 මාර්තු 31 හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට නියමිත සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 29 දින දී විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

**2.2.2 නොපිය වූ ශේෂ**

---

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පැවති තරුණයින් පුහුණු කිරීමේ වැඩසටහනේ සේවා සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු රු. 900,000 ක් 2013 සිට නොපියවා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | 2015 දෙසැම්බර් 31 දිනට |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| කෘසංජාඅ | 25.00 | 3,268.75 | 1,404.00 | 26.38 | 224.57 |
| පුද්ගලික සමාගම් | 5.25 | 686.44 | - | - | - |
| ප්‍රමූසං | 0.76 | 99.37 | - | - | - |
| සමූආ | 0.39 | 50.99 | - | - | - |
| නිෂ්පාදකයින් | 0.57 | 74.53 | - | - | - |
| ශ්‍රීලංර | 0.99 | 129.44 | 107.90 | 1.93 | 14.90 |
| | **32.96** | **4,309.52** | **1,511.90** | **28.31** | **239.47** |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු මඟින් සිදු කළ රු. මිලියන 1,511.90 ක වෙන්කිරීම්වලින් සියයට 1.87 ක් වන රු. මිලියන 28.31 ක් වැඩසටහන උපයෝජනය කර තිබුණි. වෙන්කිරීම්වල මෙබඳු ඌන උපයෝජනයන් පසුගිය වර්ෂ සඳහාද මාගේ වාර්තාවල පෙන්වා දී තිබුණු අතර වැඩසටහන විසින් වාර්ෂික මූල්‍ය ඉලක්ක අඛන්ඩව සපුරාගෙන නොමැති බව මෙමඟින් පෙන්නුම් කෙරේ.

(ආ) මූල්‍ය ගිවිසුම අනුව, මුළු වෙන්කිරිමෙන් සියයට 24.15 ක් නියෝජනය වන එජඩො මිලියන 7.96 ක් වටිනාකම් දාම සංවර්ධන ක්‍රියාකාරකම් වල නියුතු පුද්ගලික සමාගම්, නිෂ්පාදකයින්, ප්‍රජා මූල සංවිධාන, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් දායක වීමට අපේක්ෂිත විය. කෙසේ වෙතත් අදාළ පාර්ශවයන් මුළුමනින්ම දායකත්වය සිදු කිරීමට පියවර ගෙන නොතිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

අලෙවි දාම සංවර්ධනය හා සම්බන්ධතා ද ශුද්ධ මූල්‍යයනයන් සැපයීම මෙන්ම තරුණයන් සඳහා පුහුණුව ආදිය වෙත පුද්ගලික අංශය හා ප්‍රජා මූල්‍ය සංවිධාන යොමුකිරීම වැනි සංරචක යටතේ වැඩසටහනේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කළ තොරතුරු අනුව, අලෙවි දාම සංවර්ධනය හා සම්බන්ධතා සංරචකය යටතේ ප්‍රතිලාභීන් 49,184 ක් ආවරණය කිරීමට පුද්ගලික අංශයේ ව්‍යාපාර ආයතන හා ප්‍රජා මූලා සංවිධානවලින් ව්‍යාපාර සැලසුම් 40 ක් ලැබී තිබුණු අතර එයින් ප්‍රතිලාභීන් 7,163 ක් ආවරණය වන ව්‍යාපාර සැලසුම් 06 ක් පමණක් 2015 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2014 ජනවාරි සිට නතරකර තිබූ ශුද්ධ මූලා ක්‍රියාකාරකම් 2015 දෙසැම්බරයේදී අළුත්කර තිබුණි. කෙසේ වෙතත් පසුගිය වර්ෂවල ලබාදෙන ලද උප ණයවලින් නැවත අයකරගත් රු.මිලියන 99.79 ක වාරික ශේෂ 2015 දෙසැම්බර් 31 දිනට අදාළ කාර්යයන් සඳහා භාවිතයට නොගෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂ ගිණුමක පවත්වාගෙන තිබුණි.

ඉහත ඡේදයේ දක්වා ඇති පරිදි වැඩසටහනේ සියලු සංරචක යටතේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ අඩු ප්‍රගතියක් 2015 දෙසැම්බර් 31 දිනට වැඩසටහන පෙන්නුම් කර තිබුනි. වැඩසටහන් කළමනාකරු විසින් සිදු කළ පැහැදිලි කිරීම් අනුව, වැඩසටහනේ මෙහෙයුම්වල සාර්ථකත්වය තෙවන පාර්ශව විසින් ඉදිරිපත් කළ ව්‍යාපාර සැලසුම්වල වලංගුතාවය මත රඳේ. සමාලෝචිත වර්ෂය තුළදී වැඩසටහන වෙත ලැබුණු ව්‍යාපාර සැලසුම් වල සජීවීබවේ අඩුකම හේතුවෙන් වැඩසටහනේ ප්‍රධාන ක්‍රියාකාරකම් අඩු ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. තවද, ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතන නිරන්තර වෙනස්වීම්, කාර්යාල පරිශ්‍රයන් නිරන්තර වෙනස්වීම්, සේවක ඉවත්වීම් වැඩිවීම, සේවක සාමාජිකයින් බඳවා ගැනීමේ හිඟකම, මූලා ගිවිසුමේ සඳහන් පරිදි සේවක මණ්ඩලයේ අනුමතවීමේ අඩුව ආදී වෙනත් හේතුද වැඩසටහනේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ අඩු ප්‍රගතිය සඳහා ඉවහල් වී තිබුණි.